# පෙරදිග සංගීත විෂය සාධනය තුළින් හෙළි වන සංගීත අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

**අයි. එස්. වීරක්කොඩි**
**සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
***isamindani@gmail.com***

අ.පො.ස (සා. පෙළ) විභාගය, පාසල් සිසුන් ගේ සාධන මට්ටම මැනීම සඳහා ජාතික මට්ටමින් පවත්වනු ලබන ඉතා වැදගත් විභාගයකි. එමෙන් ම ශ්‍රී ලංකාවේ වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී-සිටින විභාගය ද මෙය යි. එම විෂයට අදාළ ව කරුණු විශ්ලේෂණය කිරීම විභාගයට පෙනී-සිටින අයදුම්කරුවන්ට මෙන් ම ගුරුභවතුන්ට ද සිය ඉගැනුම් - ඉගැන්වීම හා ඇගයීම් ක්‍රියාවලියේ දී මෙන් ම ප්‍රතිපෝෂණ කාර්යයන්හී දී භාවිත කළ හැකි ප්‍රබල ආධාරකයක් වේ. ඒ අනුව සංගීත අධ්‍යාපනයේ විෂය සාධනය පිළිබඳ විමර්ශනය කරන මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය ආශ්‍රිත දත්ත විශ්ලේෂණයට භාජනය කරන ලදි. විභාගය සඳහා පෙනී-සිටි සියලුම පාසල් සිසුන් ආශ්‍රිත දත්ත ආවරණය කිරීම ප්‍රායෝගික ව කළ හැකි කාර්යයක් නොවන නිසා 2010 වර්ෂයට අදාළ ව දත්ත වැඩිවශයෙන් උපයෝගී කරගත් අතර, සාපේක්ෂ කරුණු විමර්ශනය කළ යුතු තැන් හි දී 2000 දශකයට අදාළ සංඛ්‍යා ලේඛන උපයෝගී කරගන්නා ලදී. 2010 වසරේ පෙරදිග සංගීත විෂය සඳහා සමස්ත ශ්‍රී ලංකාවෙන් ම අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 29,646 කි. අයදුම්කරුවන් සංඛ්‍යාව 41,604 කි. මෙම මුළු සංගහණය ආවරණය වන පරිදි සිසුන් 4320 ක් නැතහොත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10% කට අදාළ දත්ත මගේ නියැදිය සඳහා ඇතුළත් කරගන්නා ලදී. මෙහි නියැදි රාමුව වන්නේ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශයේ විභාග දත්ත ය. නියැදි ඒකකයක් සඳහා පෙරදිග සංගීත විෂය ඉගැන්වෙන දිස්ත්‍රික්ක 20 ක් තෝරාගැනිණ. පර්යේෂණයට භාජනය වූ පරීක්ෂණ ඒකකය වන්නේ විභාගයට පෙනී සිටි පාසල් අපේක්ෂකයන්ගේ ප්‍රායෝගික හා සිද්ධාන්ත ප්‍රශ්න පත්‍ර වෙනුවෙන් පෙරදිග සංගීතය විෂයේ සාධනය යි.

ඉගැනුම, ඉගැන්වීම, ඇගැයුම හා විෂයය මාලාව අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන සංරචක හතර වේ. ඒවා අන්‍යෝන්‍ය බලපෑමකින් යුතු ව ක්‍රියා කරන අතර. එකිනෙක සංවර්ධනය කෙරෙහි එම සංරචක සම්ප්‍රදායික ලෙස අන්‍යෝන්‍ය වශයෙන් බලපෑමක් ඇති කරයි.

***ප්‍රමුඛ පද :*** *සෞන්දර්ය අධ්‍යාපනය, සංගීත අධ්‍යාපනය, සංගීතය, විෂය මාලාව, පෙරදිග සංගීතය, ඇගයීම*